# සීතාවක පුරාණය



# පරංගියා කෝට්ටෙ ගිය වගයි

ගෝවේ ප්‍රතිකාල් යුව රජුගේ පුත් දොන් ලොරෙන්සෝද අල්මේදා ක්‍රි.ව. 1505 දී ගාල්ලෙන් ලක්දිවට ගොඩ බැස්සේය. එකල කෝට්ටේ රජු ධර්ම පරාක්‍රමබාහුය. රජු බැහැදැකීමට පරංගි තානාපති නිලධාරීන් කෝට්ටේ රජ භවනට කැඳවා ගෙන යනු සැතපුම් හය යාමට තුන් දිනක් ගතවීලු. තුන්මස් තුන් පෝයක් ගතවූ බව ගැමියෝ කියති. ඔවුන් රජු සමඟ සුහඳ වීමෙන් පසුව පෘතුගීසි රාජ්‍ය ලාංඡනය සහිත ගල් පුවරුවක් (දැනට කොටුවේ ගෝඩ්න් උයනේ) සිටුවා ආපසු ගියහ. පෙරදිගින් කුරුඳු ගම්මිරිස් වැනි කුළුබඩු ද ඇත්දත්, මැණික් වැනි දෑ ද මෙතෙක් යුරෝපීය රටවල සැපයුවේ මුස්ලිම් වෙළෙන්දන් මගිනි. මුලදී පෘතුගීසීන්ගේ ප්‍රධාන අරමුණ වූයේ එම වෙළදාම ඔවුන් අතට කඩා ගැනීමයි.

ක්‍රි.ව.1518 දී ගෝවේ සිට ලෝපෙස් සවාරිස් ද ඇල්බගේරියා නම් ප්‍රතිරාජයා නැව් 17 කින් සෙනග ගෙන කොළඹට පැමිණ ගබඩාවක් ඉදි කිරීමට ඇරඹීය. සිංහල රජුගෙන් මේ සඳහා ඔවුන් ඉල්ලා සිටියේ ගෙරි සමක් එලා ගැනීමට ඉඩ පමණී. එහෙත් ඔවුන් ගෙරි සම සිහින් තීරුවලට කපා එයින් වටකළ හැකි භූමිය මේ සඳහා යොදාගත් බව කියනු ලැබේ. ඒ වෙනුවට කප්පමක් ගෙවීමට රජු පොරොන්දු විය. ක්‍රි.ව.1520 දී ලෝ පෝද බ්‍රිටෝ පැමිණ බළ කොටුවක් ඉදි කිරීමට පටන් ගත්තේය. මෙය මුස්ලිම් වරුන්ගේත් සිංහලයන්ගේත් බියට හේතු විය. ඒ නිසාම ගැටුම් ඇතිවිය. සිංහලයෝ පසු බැස්සාහ. එහෙත් එම සටන උග්‍ර එකක් වු බවත් සිංහලයන්ගේ යුද ශක්තිය උසස් බවත් ඩී. බරෝස් නමැති ඉතිහාසඥයා ඉහලින් වර්ණනා කරයි.

ක්‍රි.පූ. යුගයේදී මිහිඳු හිමියන් ද සංඝමිත්තා ස්ථවිරීන්ද ලංකාවට පැමිණියේ අප කෙරෙහි අනුකම්පාවෙනි. එහෙත් එදා සිට මේ දක්වාම ද්‍රවිඩ සන්න්‍යාසි, මුස්ලිම්, පෘතුගීසි, ඕලන්ද, ඉංග්‍රිසි ආදී කිසිවෙක් අප කෙරෙහි දයාවෙන් මෙහි නොආහ. ඔවුහු කවුරුත් මේ රටේ ධනය ඒ රට වලට ගෙන ගියහ. ඉංග්‍රීසීන් මෙහි ආර්ථික වැවිලි ඇති කළේ අපේ සාර ධනය උරා ගැනීමටයි. ඉන්දියානුවන් ගෙන්වා අපට නැති ප්‍රශ්න ඇති කළේ අපට ආදරයෙන් නොවේ. අද පවා නිදහස් වෙළඳ ආර්ථිකය තුළ මුදල් ආයෝජනය කරන බහු ජාතික සමාගම් කාරයන්ගේ අරමුණද අපේ ධනයෙන් ශ්‍රමයෙන් ඵල ලැබීමයි. මහින්දාගමනයත් සංඝමිත්තාගමනයත් හැරුනු විට අනික් සියළුම සංක්‍රමණයන්ගේ ප්‍රතිඵල වශයෙන් මේ රටේ කවර හෝ ගැටළුවක් ඉතිරි විය. විජයාගමණය රාමැවතරණය දෙකම මේ රටේ ස්වාධීනත්වයට පහර වැදුණු අවස්ථාවන්ය. ගැමුණු, වළගම්බා, විජයබා, පැරකුම්බා, මායාදුන්න, රාජසිංහ වැනි ඇතැම් පාලකයන් පමණක් එම විදේශ බලපෑම් වලින් රට මුදා ගැනීමේ ස්වාධීන අරමුණ දැරූහ.

රට කෑලි වලට කඩාගෙන බලය විමධ්‍ය ගත කර පාලනය කිරීමේ ප්‍රතිපත්තිය කවදත් මෙරටට අහිතකර විය. සීතාවක යුගය විශේෂයෙන් මේ අතින් කැපී පෙනෙන අවධියකි. හැම තැනම ප්‍රදේශාධිපතිහු වූහ. උඩුගම්පල සකල කලා වල්ලභයන්ය. මාදම්පේ තනිය වල්ලභයන්ය. මැණික් කඩවර, කෝට්ටේ, රයිගම, මහනුවර, සීතාවක, ඌව, යාපනය ඒ හැමතැනම ප්‍රදේශාධිපතියෝ වූහ. රටේ අසමගියත් නායකයන් ගේ බලකාමිත්වයත් නිසා රට එක්සත් කිරීමේ වෑයම නිශ්පල එකක් විය. එකෙකු මරාගෙන අනෙකා රජවීමට විවිධ කුමන්ත්‍රණ පහළ විය. උපදේශක වරුන් හැටියට සිටියෝ පවා සත්‍යයට පිටුපා කුමන්ත්‍රණ වලට හවුල් වූහ. ටිකිරි බණ්ඩාර වැන්නන්ගෙන් මේ රටට වැඩක් ගත නොහැකි වූයේ මේ හේතුවෙනි.

කෙසේ හෝ වේවා දිගු ගමනකින් පසු සිංහලය දුටු පරංගියාට මෙරට සම්පූර්ණයෙන් ගිල ගැනීමට නොහැකි උනත් කපිතාන් ජේදෝ ලෝපෙස් ද සූසා, දොන් ජොරනිමෝද අසවේදෝ වැනි කෲර පාලකයන්ට මුහුදුබඩ ප්‍රදේශවල පාලනය ගෙන යෑමේ වරය උදා උනේ බුවනෙකබාහු ධර්මපාල වැන්නන්ගේ දුර්වලකම් නිසාය. දරුණු කමෙන් අන්තයට ගිය මේ අය බෞද්ධ භික්ෂූන් වහන්සේලා කෝට්ටෙන් පළවා හැරියහ. සිංහලයන් අමු අමුවෙන් මරා දමද්දී බිළිඳුන් මව්වරුන් ලවා ගලේ ලා අඹරවද්දී අසවේදෝ බලා සිටියේ තෘප්තිමත් හැඟීමෙනි.

මෙසේ සිංහලයන්ගේ සාපයට ලක්විය යුතු පෘතුගීසි පාලනය පැවති සියවස් එකහමාරක් පමණ කාලය තුළ ඔවුන් කළ කී දෙයින් අපට ඉතිරි වී ඇත්තේ ඔවුන්ගේ පුද්ගල නාමයන් ටිකකුත් එදිනෙදා පාවිච්චි කරන වචන සමුදායකුත් කපිරිඤ්ඤා සංගීතයත් පමණී. මුලින් අප-ගේ පාලකයෝ ඔවුන්ගේ ආගම වැළඳගෙන ඔවුන්-ගේ නම් වලින් බෞතීස්ම ලැබූහ. දොන් ජුවන් ධර්මපාල දොන් ජොන් කොනප්පු බණ්ඩාර, දොන් පිලිප් යමසිංහ බණ්ඩාර, දුමින්දෝ ද කොරයා, දෝන කැතරිනා වැනි නායකයන් අනුව ගිය සාමාන්‍ය ජනතාවද, පෘතුගීසීන්ගේ බලකිරීම් හා විවිධ බලපෑම් නිසා පරංගි නම් වලින් හැඳින්වීමට පුරුදු වූහ.

අගොස්තීනු, අද්‍රියන්, සිංඤෝ අන්තෝනි, අපොන්සු, අබරන්, පබිලින්, අමදෝරිස්, අමාරිස්, අලිසන්ද්‍රි, අල්මේදා, ආබ්‍රේව්, කබරාල්, කරෝලිස්, කල්දේරා, ක්‍රිස්තියන්, කොරෙයා, කොර්නේලිස්, කොස්තා, ගාබ්‍රියෙල්, ජුවන්, ජෝන්, ජුසේ, ජෝකිනු, දනියෙල්, නිකොලොස්, පස්කුවල්, පෑලිස්, පිගේරා, පිලිප්, පීරිස්, පෙරේරා, සිපිරියානු, සෙලෙස්තියන්, අගිද්‍ර, අගොස්තිනා, ඇංජලිනා, ඕල්ගා, එමලියා, කර්ලිනා, තෙරේසා, රෝසා, ලූසියා, සිසිලියා, සොපියා, හෙලේනා වැනි නම් වලින් සිංහලයන් හැඳින්වෙන්නට පටන් ගන්නේ පෘතුගීසීන් ගේ පැමිණීමේ ප්‍රතිඵලයක් හැටියටය. එසේම මේස, බංකු, විස්කෝතු, පීකුදු, කේජු, ගෝවා, සලාද, කෝප්ප, පිඟන්, පලඟාන්, සපත්තු, කලිසම්, මේස්, කබා, බොත්තම්, ලේන්සු, කසාද, පෙරගම, බයිලා, මිනිට්ටු, ඉස්කෝල, ලාදුරු, පුයර, බෝනික්කා වැනි වචන සමුද්‍රයක් අප බසට එක්විය. මෙම නාම හා වචන මහාචාර්ය වී.ඊ. හෙට්ටිආරච්චි සූරීන් ගේ දේශනයකදී ලියාගත් ඒවාය.

පරංගීන් ගේ වධයෙන් මිදෙන්නට උපක්‍රම සෙවු දෙවන රාජසිංහ වැනි පාලකයෝ වෙනත් අයගේ ආධාර සෙවූහ. 17 වැනි සියවස මැද භාගයේ දී ඕලන්ද වර්ගයා පෙරදිග රටවල වාණිජ කටයුතු වලට මැදිහත් වෙමින් සිටියහ. අපේ රජවරු ඔවුන් සමග මිතුරු වී ඔවුන්ට රටේ මුහුදු බඩ ප්‍රදේශ භාර දීම ඉඟුරු දී මිරිස් ගත්තා වැනි විය. කැහි ගෑනි දී හොටු ගෑනි ගත්තා වැනි විය. මෙසේ පරංගියා කෝට්ටේ යාමෙන් ඇරඹුන පෘතුගීසි අවදිය, ඉඟුරු දී මිරිස් ගැනීමෙන් අවසන් වූයේ අවිචාරවත් අවාසනාවන්ත කාල පරිච්ඡේදයක කොටසක් ගෙවා දමමින්ය.

කෘෂි කාර්මික ගැමි ආර්ථිකය

පැරණි සීතාවක ප්‍රදේශයේ ආර්ථිකය ගොඩ නැගී තිබුනේ ග්‍රාමීය කෘෂිකර්මාන්තය පදනම් කර ගෙනය. වසර පුරාම වර්ෂාපතනයක් ලැබෙන බැවින් වැසි ජලයෙන් වී ගොවිතැන් කිරීම ප්‍රධාන තැන ගති. එදා පැවති වැඩ වසම් ක්‍රමයට ගැමියෝ පුරුදු වී සිටියහ. මානියම්ගම මහයාට දුන් නියම් ගමයි. මාගම්මන මහා ගම්මානයකි. අටුළුගම, කනංගම, දෙබෑගම, යෝගම, යාලේගම, කොස්ගම, රංගේගම වැනි ග්‍රාම නාමයෙන් කුඩා ජනපද හැඳින්විණි. ක්‍රි.පූ. අවධියේ සිට ගම් නායකයා "ගමික" නම් විය. (රජලෙණ ලිපිය) දියුරුම් පිටිය, දෙහිගහපිටිය, තලාවිටිය, දෙහිඕවිට, පුවක්පිටිය, ඇපලපිටිය, වැලිවිටිය, තැලුම්පිටිය වැනි තැනි බිම් රැසක් ද සීතාවක වටා වේ.

එදා නිවර්තන කලාපීය වනාන්තර වලින් වැසී පැවතුණු කඳු මුදුන් අධිරාජ්‍යවාදීන් පුරුදු කළ ආර්ථික වගාවක් වූ රබර් නිසා අස්වාභාවික ස්වරූපයක් ගති. මේ නිසාම සෝදා පාලුවට යටත් වූ සියළුම කඳු මත කළුගල් මතු වී ඇත. දිය කඳුරු දෙපස තැනිබිම් වල ගංවතුරෙන් ගෙන ආ දියලු පස් තැන්පත් වූ සරුබිම් වී වගාවට යොදා ගෙන ඇත. කුඹුරු වලට ඉහළ බිමේ මිනිසුන් පදිංචි වී සිටි ගම්ගොඩ වල එදිනෙදා ජීවිතයට අවශ්‍ය වු ඖෂධය පවා ගමෙන්ම ලබා ගන්නට හැකි විය. ඔවුන්ගේ ස්වයං පෝෂණයට වනයද බොහෝ දුරට ඉවහල් විය. ඇතැම්විට ගැමියෝ හෙල් බෑවුම් එළි පෙහෙළි කර හේන් කොටා ඇල් වී කුරක්කන් වැනි දෑ වැවූහ. පන්විලේ හේන, වී අව්ව හේන, ඔලියැදපු හේන වැනි හේන් නාමයෙන් හැඳින්වෙන ඉඩම් හෙල් බෑවුම්වල ඇත. එදිනෙදා ජීවිත යාපනයට අදාල සියළුම දේ ගමේම නිපදවා ගෙන ඇත. රෙදිපිළි, ලුණු වැනි දේ පමණක් පිටින් ලබා ගන්නට ඇත.


තල්දුව, කඹුරාපොල වැනි දේවාල ගම් වලින් දේවාලයේ සියළුම කාර්යයන් ඉටු කිරීම ඉඩම් භුක්ති වින්ද අය දේවාලය වෙනුවෙන් නියමිත කාර්යයක නිරත වූහ. මුත්තෙට්ටුව රාජකාරී කටයුතු සඳහා විදානේට නියමිත කුඹුරයි ලේකමලෑ වත්ත, රදාතොටේ ඉඩම, ආචාරිගෙ වත්ත, නැකතියෑ කුඹුර, බඩ හැලයෑ කුඹුර ආදිය ඒ ඒ කාර්යයන් සඳහා පැවරී තිබුනි. අද මේ රාජකාරී වෙනුවෙන් දේවාලය බදුමුදල් අයකර ගනු ලැබේ. කඹුරාපොල කර්මාන්ත කරුවන්ගේ ගමක් වන්නට ඇත. කෝරළේ ඉඩම් නමින් වු සමහර ඉඩම් දේවාලයට නොව කෝරළේට අයිති වු ඒවාය.

සාම්ප්‍රදායිකව කෙරුණු වී වගාව විශේෂ චාරිත්‍ර, වාරිත්‍ර විධි වලටම යටත්ව සිදුවිය. සී සෑමට අවශ්‍ය ගව සම්පත ගමෙන් සොයා ගත හැකිවිය. සියළුම වැඩ අත්තම් ක්‍රමයට කෙරුණි. අස්වනු සරු කිරීමට අද මෙන් රසායන විධි භාවිතා නොවීය. ඒ සඳහා විශේෂ කෙම් විධි අනුගමනය කෙරිණි. අස්වනු සරු වුයේ දෙවියන් යකුන් සතුටු වු තරමටයි. අධික තෘෂ්ණාව ඒ නිසා අඩුවිය. ගොයම් කැපීම කුඹුර නෙලීම, සී සෑම, මැඩවීම ආදී සියළු කටයුතු වලදී මෙහෙ ගී ගැයීම විඩාව අමතක කිරීමට හේතු විය. කයි බත කුඹුරට නැතිවම බැරි අංගයක් විය. ගෙවිලිය කුඹුරට ගෙන ආ ඇඹුල වේල හැම දෙනම සතුටින් අනුභව කළහ. අස්වනු කෙරෙහි තෘෂ්ණාව අඩු වු නිසාම ඔවුහු ලද පමණින් සතුටු වූහ. අස්වනු අඩු වීම හෝ වැඩිවීම දෙවියන්ගේ කැමැත්ත අනුවම සිදුවන බව විශ්වාස කළහ. එබැවින් දෙවියන් යකුන් සතුටු කිරීමට අවශ්‍ය පිළිවෙත් පිරූහ. පරිභෝජනයට වඩා වැඩිපුර නිෂ්පාදනය වු ගම්මිරිස්, පුවක්, කුරුඳු වැනි දෑ මුස්ලිම් වෙළෙන්දන්ට විකුණා ඒ වෙනුවට ඔවුන්ට අවශ්‍ය දේ ලබාගත් බව පෙනේ. සිංහලයන් හා මුස්ලිම් වරුන් සංස්කෘතීන් දෙකකට අයත් වුවත් ආරවුල් පැන නොනැගුනි. දෙගොල්ල අතර වැඩී ගිය සමගි දම ප්‍රකාශවන නොඑකුත් ගැමි කතන්දර ගෙතුනි.

ගමනාගමන මාර්ග දියුණු තත්ත්වයක තිබුණු බවක් නොපෙනේ. එහෙත් සීතාවක සිට ගැටහැත්ත දක්වා පළල් මාවතක් තිබුණු බව පෙනේ. එම මාවත සබරගමුව දක්වාම විහිදී තිබුණි. උඩරටට ප්‍රධාන මාවත වැටී තිබුණේ තල්දූව, ඇපලපිටිය, යාලෙගම, දයිගල හරහා රුවන්වැල්ලට වැටෙන සේය. අටුළුගම හරහාද සාමාන්‍ය මාර්ගයක් තිබී ඇත. හංවැල්ල හරහා කොළඹට ප්‍රධාන මාවතක් තිබෙන්නට හැකිය. සීතාවක නදියත් කැළණි නදියත් දිගේ ඔරු, පාරු, අඟුල් වලින් ගමන්යාම සිරිතක්ව තිබුණි. රාජසිංහ රජතුමා නිතර පෙතංගොඩ උයනට ගමන් ගත්තේ ගඟ දිගේ දේව අඟුලෙනි. අවසන් ගමන ගියේද අඟුලෙන්ය.

මැණික් සෙවීම බොහෝ කාලයක සිට රත්නපුර දිශාවට අයත් ප්‍රදේශයේ ප්‍රචලිතව පැවතුණු අතර ඇත්දත් සැපයීමද ප්‍රදේශයේ ජනප්‍රිය විය.

යුරෝපීයයන් අනුව සිතන්නට හා ජීවත් වන්නට පුරුදු වෙමින් ඔවුන්ගේ නම් ගම් පවා භාවිතා කරමින් ආගමද වෙනස් කර සංකර සමාජයක් ගොඩ නැගෙන්නට ආරම්භ උනේ ධර්මපාල රජු දොන් ජුවන් නමින් බෞතීස්ම ලබා එම ආගම වැළඳගෙන පෘතුගීසින්ගේ ගැත්තකු බවට පත් වීමෙන් අනතුරුවය. පැරණි කෘෂිකාර්මික ගැමි සමාජයේ පැවති සාරධර්ම ක්‍රමයෙන් අභාවයට යමින් නිසරු සංකර රටාවකට අනුව දිවි ගෙවන්නට පුරුදු වී සිටිමු.



ශාස්ත්‍රවේදී
නා. ලි. සාර්ලිස් අමරසිරි

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සදහන් අංකයනට අමතන්න

මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත

LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243